ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

කාර්යසාධන වාර්තාව - 2019

ප්‍රකාශනය

ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

“සුහුරුපාය”, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

CM 32499 - 100(07/2020) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2019
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 226

අන්තර්ගතය

	පිටු අංකය
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	**01**
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම	**17**
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	**20**
පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක	**37**
පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	**38**
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	**39**
පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව	**45**

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1. හැඳින්වීම

2019 වසරේදී 70 වන සංවත්සරය සැමරූ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධනයන්ගේද, 1956 ආගාමික හා විගාමික පනතට අදාළව සැකසූ රෙගුලාසි හා එහි සංශෝධනයන්ගේද, පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ පනත්වල විධිවිධානයන් යටතේ ද ලද නෛතික අධිකාරිය මත ක්‍රියාත්මක වේ.

ජාතික ආරක්ෂාව තහවුරු කරමින් ශ්‍රී ලාංකීය පුරවැසියන් නොවන තැනැත්තන් මෙරටට ඇතුළුවීම හා පිටවීම විධිමත්ව පාලනය කිරීම හා විදේශිකයන්ට වීසා නිකුත් කිරීම, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විදේශියන්හිදී තහවුරු කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවය මත විදේශ ගමන් බලපත් නිකුත් කිරීම, විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ දරුවන් සඳහා සහ මෙරට පුරවැසිභාවය ඉල්ලුම් කරන තැනැත්තන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වේ.

ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමට අදාළ ප්‍රත්‍යන්ත පාලනයේදී ද අනෙකුත් දෙපාර්තමේන්තුමය කාර්ය භාරයන් තුළදී ද නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සේවාලාභීන්ට වඩා කාර්යක්ෂම හා සුහදශීලී සේවයක් සපයාදීමට කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් කැපවී ක්‍රියා කරයි.

එසේම අගෝස්තු මස සිට රටවල් 48 ක් සඳහා වීසා ගාස්තු අය කිරීම නිදහස් කර තිබුණ ද 2019 වසර තුළදී දෙපාර්තමේන්තුවට ජාතික ආදායම සඳහා රුපියල් බිලියන 14.054 ක් රැස්කර දීමට හැකියාව ලැබී තිබුණි.

නෛතික අධිකාරිය

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවර
- 1948 අංක 18 දරන පුරවැසි පනත සහ ඊට අදාළ සංශෝධන
- 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත සහ ඊට අදාළ සංශෝධන
- 1949 අංක 03 දරන ඉන්දියානු හා පකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත හා ඊට අදාළ සංශෝධන
- 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2008 අංක 38 දරන චීන සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- ඉහත පනත්වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- ආගමන විගමන පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

1.2 දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු

දැක්ම

කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම

මෙහෙවර

ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතීන් සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම

අරමුණු

- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පාර්ශ්වකරුවෙක් ලෙස කටයුතු කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නම් කරන ලද තොටුපළ හරහා නීත්‍යනුකූලව ඇතුළුවීම හා පිටවීම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- ශ්‍රී ලාංකික අනන්‍යතාවය විදේශයන්හිදී තහවුරු කිරීම.
- සේවාලාභීන් සඳහා ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් සැපයීම තුළින් රාජ්‍ය සේවයේ විශිෂ්ටතම රාජ්‍ය ආයතනය බවට පත්වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රීලංකාවට ඇතුළුවීම පාලනය කිරීම හා පිටවීම විධිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත් කිරීම
- ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම
- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත් නිකුත් කිරීම
- විදේශිකයින් සඳහා වීසා බලපත් නිකුත් කිරීම

1.4 සංවිධාන සටහන

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ශාඛාවන්

- 01. පාලන අංශය
  - පාලන ශාඛාව
  - පුහුණු හා සංවර්ධන ශාඛාව
  - ප්‍රසම්පාදන ශාඛාව
  - ඵලදායීතා ප්‍රවර්ධන ඒකකය
- 02. ගමන් බලපත් අංශය
  - ගමන් බලපත්‍ර ශාඛාව
  - ප්‍රාදේශීය කාර්යාල (මහනුවර, මාතර, කුරුණෑගල සහ වවුනියාව)
  - ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව
  - ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව
  - විදේශ දූත මණ්ඩල ශාඛාව
  - තැපැල් ශාඛාව
- 03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ
  - ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව
  - ඉන්දු ලංකා පුරවැසි ශාඛාව
  - නීති ශාඛාව
- 04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය
  - වීසා ශාඛාව
  - තොටුපළ ශාඛාව
  - විමර්ශන ශාඛාව
- 05. පුරවැසි අංශය
- 06. තොරතුරු තාක්ෂණ අංශය
- 07. ගිණුම් අංශය
- 08. අභ්‍යන්තර විගණන අංශය

01. පාලන අංශය

පාලක (පාලන) ගේ අධීක්ෂණය යටතේ පහත ශාඛාවන් ක්‍රියාත්මක වේ.

01.1 පාලන ශාඛාව

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, දෙපාර්තමේන්තුව සතු වාහන පරිහරණය, කළමනාකරණය හා නඩත්තු කටයුතු මෙම ශාඛාව යටතේ ක්‍රියාත්මක වේ.

01.2 පුහුණු හා සංවර්ධන ශාඛාව

දෙපාර්තමේන්තුවේ සමස්ත අරමුණු ඉටු කරගැනීම සඳහා දායකත්වය ලබා දෙන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය හා අභිප්‍රේරණය ඉහළ නැංවීම සහ ප්‍රශස්ත මහජන සේවාවක් ලබා දීමේදී ඒ සඳහා වන විවිධ ක්‍රියාකාරකම් හඳුනාගැනීමට හා ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම, පුහුණු හා සංවර්ධන ශාඛාවේ අරමුණ වේ.

01.3 ප්‍රසම්පාදන ශාඛාව

දෙපාර්තමේන්තුවට අදාළ සියලුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලබන්නේ මෙම ශාඛාව විසිනි. මෙම දෙපාර්තමේන්තුවට වාර්ෂිකව අවශ්‍ය කරන භාණ්ඩ හා සේවාවන් නිවැරදිව හා විනිවිදභාවයෙන් යුතුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ඊට අදාළ නීති රීති අනුගමනය කරමින් ප්‍රසම්පාදනය කිරීම මෙම ශාඛාවේ අරමුණ වේ.

01.4 ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය

විශිෂ්ඨතම සේවාවක් ලබාදෙන ආයතනයක් ලෙස වසර ගණනාවක් අඛණ්ඩව සම්මානයන්ගෙන් ඇගයීමට ලක්ව ඇති මෙම දෙපාර්තමේන්තුවේ සේවාවන් තවදුරටත් කාර්යක්ෂමව හා සඵලදායීව පවත්වා ගැනීමේ අරමුණින් 2017 වර්ෂයේදී මෙම ඒකකය ස්ථාපිත කරන ලදී.

02. ගමන් බලපත්‍ර අංශය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මහජනයා සමග වඩාත් සමීපතම අංශය මෙන්ම විශාලතම අංශය වන්නේ ගමන් බලපත් අංශයයි. පාලක (ගමන් බලපත්) ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය, ශ්‍රී ලාංකික පුරවැසියන්ට විදේශ රටවලට ගමන් කිරීම සඳහා, විදේශයකදී ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිබිඹු වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්ණායකයන්ට අනුගත ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමුඛ වගකීම දරනු ලබයි. පුරවැසියන්ගේ ප්‍රමුඛ අවශ්‍යතාවන් හඳුනාගනිමින් සාමාන්‍ය සේවය යටතේ සහ එක් දින සේවය යටතේ ගමන් බලපත්‍ර නිකුත් කරනු ලබන මෙම අංශයේ කටයුතු මහනුවර, මාතර, කුරුණෑගල සහ වවුනියාව යන ප්‍රාදේශීය කාර්යාල 04 මගින් ජාල ගතකර දියත් කරනු ලැබේ. මෙම ප්‍රාදේශීය කාර්යාල නියෝජ්‍ය /සහකාර පාලකවරුන් 4 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ එක් දින සේවාව ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන කාර්යාලයේ පමණි. මෙම අංශය යටතේ ශාඛාවන් 05ක් ක්‍රියාත්මක වේ.

02.1 ගමන් බලපත්‍ර ශාඛාව

දෙපාර්තමේන්තුව වෙත වැඩිම සේවාලාභීන් පිරිසක් පැමිණෙනු ලබන්නේ මෙම අංශයට වන අතර එය දිනකට 2500 ක් පමණවේ. මහජනතාව වෙත වඩාත් සමීප, කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් සැපයීමේ අරමුණින් එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව යටතේ ගමන් බලපත් නිකුත් කිරීම සිදු වේ.

එසේම සාමාන්‍ය සේවය යටතේ භාර දී ඇති ඉල්ලුම්පත් වලට අදාළ ගමන් බලපත් නියමිත දිනට සකස් වී නොතිබුණ විට හදිසි අවශ්‍යතාවය මත ලබා ගැනීම සඳහා පැමිණෙන අයදුම්කරුවන්ට “එදිනම නිකුත් කිරීමේ ක්‍රමය” යටතේ ගමන් බලපත් සකස් කර දීම ද මෙම ශාඛාව මගින් සිදු කරනු ලබයි.

2019 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සියලුම ගමන් බලපත් සංඛ්‍යාව

රාජ්‍ය තාන්ත්‍රික	රාජකාරී	සියලු රටවල්	මැද පෙරදිග	හදිසි සහතික	හඳුනාගැනීමේ සහතික	එකතුව
314	1585	545883	3916	19674	01	571373

02.2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමු වන අයදුම්පත්‍ර අදාළ පරීක්ෂා කිරීම් වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි.

දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝකනය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍රවල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා ගමන් බලපත්‍රයේ 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, සැසඳීම හා 4 වන පිටුව ස්කෑන් කිරීම (Compare & 4th Page Scan) සහ අවසාන තත්ත්ව පරීක්ෂාව (Quality Confirm) සිදු කර ඉන් අනතුරුව එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් නිකුත් කිරීමේ කවුළු වෙතත්, සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් ශාඛාව වෙතටත්, විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන අයදුම්පත් වෙනුවෙන් නිකුත් කරන ගමන් බලපත් විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.

මීට අමතරව සංශෝධන කටයුතු සඳහා යොමු කෙරෙන අයදුම්පත්‍ර අදාළ පරීක්ෂා කිරීම් වලින් අනතුරුව දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) ද සිදු කරනු ලබයි.

02.3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

නිකුත් කරන ලද ගමන් බලපත්‍රවලට අදාළව ගමන් බලපත්‍රධාරීන් පසුව කරන ඉල්ලීම් සලකා බලා විවිධ කාණ්ඩ යටතේ සංශෝධන ගමන් බලපත්‍රයට ඇතුළත් කිරීම මෙම ශාඛාව මගින් සිදුකරනු ලබයි.

2019 වර්ෂය තුළ සිදුකරනු ලැබූ සංශෝධන සංඛ්‍යාව

ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	එකතුව
4076	3646	3938	2801	3615	3392	4725	4109	3501	4361	3593	3747	45504

02.4 විදේශ දූත මණ්ඩල ශාඛාව

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ගමන් බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. විදේශ දූත මණ්ඩල මගින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙන අයදුම්පත් සඳහා සකස් කළ නව ගමන් බලපත් නැවත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත යොමු කරන අතර විදේශ දූත මණ්ඩල මගින් අදාළ අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සිදු කරයි.

2019 වර්ෂය තුළ මෙම ශාඛාව මගින් නිකුත් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව

මාසය	සංඛ්‍යාව
ජනවාරි	3785
පෙබරවාරි	2681
මාර්තු	4035
අප්‍රේල්	4088
මැයි	5448
ජුනි	3858
ජූලි	3684
අගෝස්තු	3778
සැප්තැම්බර්	3593
ඔක්තෝම්බර්	4052
නොවැම්බර්	3142
දෙසැම්බර්	2950
එකතුව	**45094**

2.5 තැපැල් ශාඛාව

සාමාන්‍ය සේවය යටතේ සකස් කරනු ලබන ගමන් බලපත් අයදුම්කරුවන්ට ප්‍රමාදයකින් තොරව ලියාපදිංචි තැපැල මගින් යැවීම ශාඛාවේ ප්‍රධාන කාර්යය වේ.

03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) ගේ අධීක්ෂණය යටතේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව, ඉන්දු ලංකා පුරවැසි ශාඛාව හා නීති ශාඛාව ක්‍රියාත්මක වේ.

03.1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා ප්‍රතිපත්ති සම්පාදන කටයුතු වඩාත් සැලසුම් සහගතව හා වඩා විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ශාඛාව ස්ථාපිත කර ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටු කිරීමේදී අදාළ වන ප්‍රතිපත්ති/සැලසුම් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට අදාළ නීති, අණ පනත් සංශෝධනය, චක්‍රලේඛ හා කාර්ය පටිපාටි සකස් කිරීම හා නිකුත් කිරීම, දෙපාර්තමේන්තුවට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම හා අනුමැතිය ලබාගැනීම. වෙනත් අමාත්‍යාංශවල අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම, කාර්ය සාධන වාර්තා, ප්‍රගති වාර්තා හා වාර්ෂික සැලසුම් සකස් කිරීම, මෙහෙයුම් අත්පොත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම, මෙම අංශයේ ප්‍රමුඛ කාර්යයන්ය.

03.2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) කටයුතු කරයි.

1949 අංක 03 දරන ඉන්දියානු හා පකිස්තානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත, 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත, 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා 2003 අංක 35 දරන ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත යන පනත්වල සඳහන් සුදුසුකම් සපුරන තැනැත්තන්ට එම පනත් ක්‍රියාත්මක වූ දිනයෙහි සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි වී ඇත. ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් වෙත පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට ආනුෂාංගික කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ කාර්ය භාරය වේ.

03.3 නීති ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යානුබද්ධ අණපනත් මගින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබා දීමටත්, අවශ්‍යතාවයන් අනුව අදාළ අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කිරීම මගින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමටත් සහාය වීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ.

04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

පාලක (වීසා හා ප්‍රත්‍යන්ත පාලන) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. වීසා කටයුතු වීසා ශාඛාව මඟින්ද, ප්‍රත්‍යන්ත පාලන කටයුතු තොටුපල හා විමර්ශන ශාඛා මගින් ද ක්‍රියාත්මක වේ.

04.1 වීසා ශාඛාව

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතේ III කොටස මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළුවීම පාලනය කරයි. ඒ යටතේ 1956 ආගමන හා විගමන රෙගුලාසි අංක 02 සිට අංක 35 ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීමට වලංගු වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දීර්ඝ කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

2019 වර්ෂය තුළ විද්‍යුත් සංචරණ අනුමැතීන් ලබා දීම්, නව වීසා නිකුත් කිරීම් සහ දීර්ඝ කිරීම් වලට අදාළ ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	2019
ඉ - සංචරණ අනුමැතිය ලබා දීම්	1533386
වාස වීසා නිකුත් කිරීම්	22600
වාස වීසා දීර්ඝ කිරීම්	34596
කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම් (සංචාරක , ව්‍යාපාරික සහ බහුවාර පිවිසුම් විසා)	61031
සාර්ක් වීසා	619
ද්විත්ව පුරවැසි භාවය ලබා ගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම් (ශ්‍රී ලාංකික)	1488
එකතුව	**1653720**

04.2 තොටුපළ ශාඛාව

ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ආර්ථික සංවර්ධනය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යමින් ශ්‍රී ලංකාවේ අනුමත තොටුපළ හරහා මෙරටට පැමිණෙන හා මෙරටින් පිටව යන විදේශිකයන්ට මෙන්ම ශ්‍රී ලාංකිකයන්ට ද කාර්යක්ෂම සේවාවක් ලබා දීම සහ තොටුපළ හරහා සිදුවන මගීන්ගේ ආගමන විගමන කටයුතු පාලනය කිරීම (ප්‍රත්‍යන්ත පාලනය) මෙම ශාඛාව මගින් සිදු වන අතර එයට අදාළ පහසුකම් සැපයීම, වෙනත් ආධාරක සේවා සැපයීම සහ විමර්ශන කටයුතු සිදු කිරීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

- ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිට වන මගීන්ගේ නිෂ්කාශන කටයුතු ඉටු කිරීම.
- විදෙස් රටවල තානාපති කාර්යාල ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර නොමැති රටවල් සඳහා ඇතුළු වීමට අවශ්‍ය වීසා ලබා ගැනීම අවශ්‍ය වන පුද්ගලයන්ගේ ගමන් බලපත් අදාළ තානාපති කාර්යාල ඇති රටවල් වෙත තැපැල් මගින් යැවීම (කුරියර් කිරීම) සඳහා අනුමැතිය ලබා දීම.
- ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශික නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම.

- විදේශ ගත වූ මගීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුළත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම.

- ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) නොමැතිව පැමිණෙන සංචාරකයන්හට තොටුපළවලදී විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබා දීම.

- උසාවි මගින් නිකුත් කර ඇති රටින් පිටවීම හා මෙරටට පැමිණීම තහනම් නියෝග ක්‍රියාත්මක කිරීම හා වෙනත් ආයතන මගින් පුද්ගලයන් රටින් පිටවීම හා රටට පැමිණීම පිළිබඳව විමසා එවන ලිපි සම්බන්ධ රාජකාරී

- ශ්‍රී ලංකාවෙන් පිටවීමේදී හා ශ්‍රී ලංකාවට පැමිණීමේදී තොටුපළවලදී මගීන් විසින් සම්පූර්ණ කළ යුතු ආගමන/ විගමන පත්‍රිකා නිකුත් කිරීම.

- තොටුපළවලට අනුයුක්ත ආගමන හා විගමන නිලධාරීන්ගේ සේවාවන් මෙහෙය වීම, අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.

අනුමත ඇතුළුවීමේ හා පිටත්වීමේ තොටුපළ

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ - කටුනායක
2. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ - මත්තල
3. කොළඹ ගුවන් තොටුපළ - රත්මලාන
4. කොග්ගල ගුවන් තොටුපළ
5. යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ
6. කොළඹ වරාය
7. ගාල්ල වරාය
8. රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය
9. ත්‍රිකුණාමල වරාය
10. තලේමන්නාරම් ජැටිය
11. නොරොච්චෝලේ වරාය
12. ඔලුවිල් වරාය

එක් එක් තොටුපළවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2019

තොටුපල	පැමිණි සංඛ්‍යාව	පිටත් වූ සංඛ්‍යාව	එකතුව
කටුනායක ගුවන් තොටුපළ	3,392,073	3,446,467	6,838,540
හම්බන්තොට වරාය	2,098	1,688	3,786
මත්තල ගුවන් තොටුපළ	149	237	386
කොළඹ වරාය	80,570	81,587	162,157
ගාල්ල වරාය	17,731	14,131	31,862
නොරොච්චෝලේ වරාය	178	180	358
ත්‍රිකුණාමලය වරාය	3,830	3,029	6,859
රත්මලාන ගුවන් තොටුපළ	121	125	246
තලේමන්නාරම් ජැටිය	-	-	-
යාපනය ගුවන් තොටුපළ	825	936	1,761
එකතුව	**3,497,575**	**3,548,380**	**7,045,955**

04.3 විමර්ශන ශාඛාව

1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා ඒ යටතේ පනවන ලද 1956 ආගමන විගමන රෙගුලාසි සහ ජාත්‍යන්තර නීතිවලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවට ඇතුළුවන හා එහි රැඳී සිටින විදේශිකයන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝනය කරමින් රැඳී සිටින විදේශිකයන් පිළිබඳව නිරීක්ෂණය කර අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු මෙහෙයවීම සහ නීතිමය ක්‍රියා මාර්ග ගැනීම මෙම අංශය මගින් සිදුකරනු ලැබේ.

2019 වසරේ විමර්ශනයට ලක් කළ හා ඉන් පසුව රටින් ඉවත් කළ විදේශිකයන් සංඛ්‍යාව පහත පරිදි වේ.

මාසය	විමර්ශනය කළ සංඛ්‍යාව	ඉවත් කළ සංඛ්‍යාව
ජනවාරි	210	103
පෙබරවාරි	190	112
මාර්තු	337	108
අප්‍රියෙල්	209	57
මැයි	236	73
ජූනි	162	75
ජූලි	131	50
අගෝස්තු	90	75
සැප්තැම්බර්	140	68
ඔක්තෝබර්	63	49
නොවැම්බර්	116	80
දෙසැම්බර්	81	48
එකතුව	**1965**	**898**

05. පුරවැසි අංශය

1948 අංක 18 දරන පුරවැසි පනතින් පුරවැසි අංශය සඳහා ව්‍යවස්ථාපිත බලය ලැබී ඇත. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිල බලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ලේකම්වරයාටය. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි ආගාමික හා විගාමික පනතින් පාලනය වන විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ සෘජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත කර ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයකු මගින් ක්‍රියාත්මක වන අතර එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මගින් ක්‍රියාත්මක වේ.

2019 වර්ෂයේ දී මෙම අංශය විසින් අත් කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

පුරවැසි පනත අනුව සහ නිකුත් කරන ලද සහතික පත් සංඛ්‍යාව

වගන්තිය	නිකුත් කළ සහතික පත් සංඛ්‍යාව
5(2) වගන්තිය	11533
8 වගන්තිය	03
11 වගන්තිය	22
12 වගන්තිය	04
19(2)/ 19(3) වගන්තිය	9147
20 වගන්තිය	58
එකතුව	20767

ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම 2019

විස්තරය	2019
පුරවැසි පනතේ 19(2) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය නැවත ලබා ගැනීම.	4791
පුරවැසි පනතේ 19(3) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය රඳවා තබා ගැනීම.	4356
එකතුව	9147

ද්විත්ව පුරවැසි සහතික ප්‍රදානය - 2019

06. තොරතුරු තාක්ෂණ අංශය

පාලක (තොරතුරු තාක්ෂණ) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව හා රජයට ප්‍රශස්ත පිරිවැයක් දැරෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම වේ.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.

මෙයට අමතරව පහත කාර්යයන්ද මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

- උසාවි නියෝග මත මගීන්ගේ ගුවන් ගමන් කටයුතු යාවත්කාලීන කිරීම.
- පාලක (ගමන් බලපත්) ගේ නියෝගය පරිදි විදේශ ගමන් බලපත් අසාදු ලේඛන ගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම
- අස්ථාන ගතවූ හෝ සොරකම් කරන ලද ගමන් බලපත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- 2019 වසර තුළදී මධ්‍යම තොරතුරු කාර්යංශය හා විදේශ දූත මණ්ඩල මගින් දෙපාර්තමේන්තුවට එවන ලද ගමන් බලපත් 12681 ක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ජාත්‍යන්තර පොලීසියේ දත්ත පද්ධතියට යොමු කර ඇත.
- ශ්‍රී ලාංකිකයන්ට වීසා ලබා දීමේදී විදේශ ගමන් බලපත්‍රයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ලංකාවේ පිහිටි තානාපති කාර්යාල මගින් සිදු කරන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම. 2019 වසරේදී එවැනි ඉල්ලීම් 1278 ක් සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

07. ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

මූල්‍ය කළමනාකරණය

ආගමන හා විගමන දෙපර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය මුදල් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් හා වියදම් පිළිබඳ කළමනාකරණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් තුළ පවත්වාගෙන යාම, භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික/මාසික වාර්තාවන් (වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, විසර්ජන ගිණුම, මාසික ගිණුම් සාරාංශ) පිළියෙල කර නියමිත දිනයන්හි භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම සහ මුදල් රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය කටයුතු මෙහෙයවීම මෙම අංශය තුළින් සිදුවන ප්‍රධාන කාර්ය භාර්ය වේ.

8. අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණක ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

අරමුණු

- දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යාම.
- දෙපාර්තමේන්තුවට නියම කෙරුණු හෝ දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමෙහි හා සැලසුම් සහ වැඩසටහන් සපුරාලීමෙහි ලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගණන් දීමේ නිලධාරියාට සහ ප්‍රගති අන්වේෂණ කමිටුවට සහාය වීම.
- උචිත අවස්ථාවලදී මෙම කර්තව්‍යයන්හි නිරත අයවලුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රගති/ අන්වේෂණ කමිටුව අතර සම්බන්ධ කාරකය ද වශයෙන් ක්‍රියා කිරීම.

කාර්ය භාරය

- වැරදි හා වංචා වැළැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරිත්වය අතින් ද සාර්ථක දැයි සොයා බැලීම.
- ගිණුම් සහ වෙනත් වාර්තාවල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහි ලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාව ඇගයීම.
- දෙපාර්තමේන්තුවේ වත්කම්, සියලුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.

- රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය විසින් සහ භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කර ඇති පරිපූරක උපදෙස් ද පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.

- නාස්තිය, නිෂ්කාර්ය ධාරිතාව සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරාගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- දෙපාර්තමේන්තුවේ ගිණුම් පරිපාටිය සහ කිසියම් මුදල් වැයවීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ දෙපාර්තමේන්තුවේ දේපළ හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම හා අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන පැවැත්වීම.

- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ඨිකෝණයෙන් බාහිරව කළමනාකරණ දෘෂ්ඨිකෝණයකින් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම.

- වැඩ, යෝජනා ක්‍රම සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩ සටහන් සහ කාල සටහන් කොතෙක් දුරට ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි යොමු වී ඇත්දැයි ඇගයීමක් කිරීම.

- වැඩ ක්‍රියාත්මකවීම ප්‍රමාද වීමට තුඩුදෙන ගැටලු ක්ෂේත්‍රයන් පිළිබඳ යාවත්කාලීන ස්ථානික විමර්ශන පැවැත්වීම.

- එවැනි මෙහෙයුම් කාර්යයන් අධීක්ෂණය කිරීමෙහි ලා භාවිතා කරනු ලබප පාලනයක් ඇගයීම හා සමාලෝචනය කිරීම.

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - නැත

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

විශේෂ ජයග්‍රහණ

1. මෙම දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රධාන නෛතික අධිකාරිය සැපයෙනුයේ 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත හා සංශෝධනයන් මඟිනි. එම පනතෙහි හා සංශෝධනයන්ගේ අඩංගු යම් විධිවිධානයන් වර්තමාන තත්ත්වයන්ට නොගැළපෙන බැව් නිරීක්ෂණය වූ බැවින් නව පනතක් ගෙන ඒමට කටයුතු කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි නීතිකෙටුම්පත් සම්පාදක විසින් පසුගිය වසරේදී නව කෙටුම්පත සකස් කරන ලදී.

2. සමෝධානික ප්‍රත්‍යන්ත කළමණාකරණ වැඩසටහන (IBM) තව දුරටත් ක්‍රමවත් කිරීමට හා මෙරටට පැමිණෙන විදේශිකයින්ට වඩා කඩිනම් සේවාවක් සැපයීමටද, ප්‍රත්‍යන්ත පාලන ක්‍රමවේදය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන ආකාරයට නිර්මාණය කර ගැනීම සඳහාද, ගුවන් මගීන් පෙර ක්‍රියාවලිගත කිරීම (APIP) හා මගී නාම වාර්තාව ලබා ගැනීමේ (PNR) පද්ධතියක් පිහිටුවීම (SITA ව්‍යාපෘතිය). මෙමගින් ගුවන් මගියෙක් පැමිණීමට පෙර, එම පුද්ගලයා එම ගුවන්යානයෙන් මෙරටට පැමිණෙන බවට තොරතුරු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ලැබේ. එම පුද්ගලයා රටට ඇතුළු කර ගන්නේද යන්න පිළිබඳ විමර්ශනයන් සඳහා වැඩි කාලයක් මෙමගින් ලැබේ.

3. දෙපාර්තමේන්තුවේ ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය, ජාත්‍යන්තර පොලීසිය (Interpol) දත්ත පද්ධතියට සම්බන්ධ කිරීම.

4. විමර්ශන ඒකකයන්හි ක්‍රියාකාරිත්වයන් හේතුවෙන් පාකිස්ථානය හා ඇෆ්ඝනිස්ථානය යන රටවලින් ශ්‍රී ලංකාවේ සරණාගත තත්ත්වය අපේක්ෂා කරන්නන්ගේ සංඛ්‍යාව අඩු කර ගැනීමට හැකි වීම.

5. ජාතික ආදායමට 2019 වසර තුළ රුපියල් බිලියන 14.054 ක් රැස් කර දීම.

6. 2019.04.21 දින ඇතිවූ පාස්කු ප්‍රහාරයක් සමඟ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පිහිටවනු ලැබූ අවදානම් තක්සේරු මධ්‍යස්ථානය (RAC) හා බණ්ඩාරනායක ගුවන්තොටුපළේ පිහිටවනු ලැබූ ප්‍රත්‍යන්ත ආවේක්ෂණ ඒකකය (BSU) මඟින් ප්‍රත්‍යන්ත පාලන කටයුතු විධිමත් භාවයකින් යුතුව සිදු කිරීමට හැකියාව ලැබුණි.



7. නවීන උපකරණ සපයා දෙමින් බණ්ඩාරණායක ගුවන්තොටුපළේ පිහිටුවා ඇති ලේඛන විද්‍යාගාරය නවීකරණය කිරීම.







අභියෝග

- **වීසා කාලය ඉක්මවා රැඳී සිටීම -** විදේශිකයන් වීසා කාලය ඉක්මවා රැඳී සිටින අවස්ථාවලදී, අදාළ පුද්ගලයා රැඳී සිටින ස්ථානය අනාවරණය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් නොමැති වීම.

- **තාවකාලිකව රඳවා ගැනීමේ පහසුකම -** ආගමන හා විගමන නීති උල්ලංඝනය කරන හා වෙනත් නීති විරෝධී කටයුතුවලට සම්බන්ධ වන විදේශිකයන් සඳහා දැනට පවතින තාවකාලික රඳවා ගැනීමේ පහසුකම් ප්‍රමාණවත් නොවීම.

- **අවදානම් සහගත පුද්ගලයන් -** රට තුළට ඇතුළු වීමට උත්සාහ ගන්නා අවදානම් සහගත පුද්ගලයන් පිළිබඳව නිරන්තරයෙන් අවධානයෙන් සිටිය යුතු වීම.

- **නිලධාරීන්ට මුහුණ පෑමට සිදුවන සෞඛ්‍ය සම්බන්ධ අවදානම් තත්ත්වයන් -** වසංගත තත්ත්වයන්හිදී ගුවන්තොටුපළ රාජකාරි සිදු කරන නිලධාරීන් මෙන්ම අනෙකුත් නිලධාරීන්ද, විදේශගතව සිට පැමිණෙන්නන් හා මහජනතාව සමග සෘජුව සම්බන්ධවන බැවින් ආසාදනයට ලක්වීමට ඇති හැකියාව වැඩිවීම.

ඉදිරි ඉලක්ක

- වීසා කාලය ඉක්මවා රැඳී සිටීම අවම කර ගැනීම සඳහා සුවිශේෂී කාර්ය මෘදුකාංගයක් (App) යොදා ගනිමින් රටපුරා විසිරී සිටින නවාතැන් සපයන්නන් සමඟ සම්බන්ධ වූ සබඳතා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශය ඇතුළු පාර්ශ්වකරුවන් සමග කටයුතු කිරීම.

- ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම හා වෙනත් නීතිවිරෝධී ක්‍රියාවල නිරත වූ විදේශිකයන් රඳවා තැබෙන මිරිහාන කඳවුරේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉඩ පහසුකම් ඇති නව රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම.

- ඉලෙක්ට්‍රොනික ආකෘතියක හිමිකරුගේ ජීව දත්ත ගබඩා කරනු ලබන විද්‍යුත් ගමන් බලපත්‍රයක් හඳුන්වාදීම.

- ගුවන් තොටුපොළ වල විද්‍යුත් ද්වාර (e-gates) භාවිතයෙන් යුතු ස්වයංක්‍රීය ප්‍රත්‍යන්ත පාලන පද්ධති ස්ථාපිත කිරීම

- ජෛවමිතික දත්ත ලබා ගැනීමේ පද්ධතියක් (ඇඟිලිවල, මුහුණේ, අත්ලෙහි සලකුණු ආදිය) ගුවන් තොටුපළ වල ස්ථාපිත කිරීම.

- වීසා කාලය දීර්ඝ කිරීම හා ගමන් බලපත්‍ර අලුත් කිරීමට අදාළ මාර්ගගත සේවා වැඩි දියුණු කිරීමට දැනටමත් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සමඟ වැඩසටහනක් සකස් කරමින් පවතී.

- දෙපාර්තමේන්තුවේ බොහෝ කටයුතු නවීන තාක්ෂණ ක්‍රමවේදයන් භාවිතයෙන් සිදුවන බැවින්, එම කටයුතු බිඳ වැටීම් වලින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාමට හා සිදු කෙරෙන ජාල ගත සියලු

03 පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒ සී ඒ - එෆ්

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	තත්‍ය 2018	
	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-		ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
19,000,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	14,098,237,046	17,258,407,246	
19,000,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		14,098,237,046	17,258,407,246	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		(10,423,457,034)	-	ඒසීඒ-3
-	තැන්පතු		1,290,758	1,095,291	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		60,291,744	-	ඒසීඒ-5/5(ඒ)
-	වෙනත් ලැබීම්		-	7,734,315	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		(10,361,874,532)	8,829,606	
19,000,000,000	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		3,736,362,513	17,267,236,852	
	අඩුකළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
757,000,000	**වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ**	5	751,393,247	645,262,684	
974,000,000	**අනෙකුත් භාණ්ඩ හා සේවා**	6	927,700,227	1,018,293,119	ඒසීඒ-2(ii)
12,600,000	**සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්**	7	12,511,326	11,925,076	
-	**පොළී ගෙවීම්**	8	-	-	
-	**වෙනත් පුනරාවර්තන වියදම්**	9	-	-	
1,743,600,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		1,691,604,799	1,675,480,879	
	මූලධන වියදම්				
12,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	8,887,859	17,464,820	
158,900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	100,508,249	195,423,368	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
8,000,000	හැකියා වර්ධනය	14	7,987,289	6,355,914	
525,700,000	වෙනත් මූලධන වියදම්	15	524,852,966	832,523,905	
704,700,000	**මුළු මූලධන වියදම් (ඉ)**		642,236,363	1,051,768,007	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)				
	තැන්පතු ගෙවීම්		7,879,928	-	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		63,583,283	-	ඒසීඒ-5/5(ඒ)
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		71,463,211	-	
2,448,300,000	**මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)**		2,405,304,373	2,727,248,886	
	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		1,331,058,140	14,539,987,966	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒ සී ඒ - පී

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
2019.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**2019** රු.	**2018** රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ පිරියත හා උපකරණ	ඒසීඒ-6	590,692,190	1,922,166,505
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	160,790,054	156,695,314
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	12,591,603	-
මුළු වත්කම්		**764,073,847**	**2,078,861,819**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		160,715,029	150,031,118
දේපළ පිරියත හා උපකරණ සංචිතය		590,692,190	1,922,166,505
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
ජංගම වගකීම්		-	-
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	75,025	6,664,196
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	12,591,603	-
මුළු වගකීම්		**764,073,847**	**2,078,861,819**

පිටු අංක…09…….සිට …33…… දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන්ද පිටු අංක …34…. සිට …44. දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර, මෙහි දී මූල්‍ය ප්‍රකාශයන් හී සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුමකරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවාඑම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තතය	
	2019	**2018**
	රු.	රු.
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	12,296,694,959	17,258,407,246
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,782,285	7,734,315
වෙනත් දෙපාර්තදමින්තු / අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**12,298,477,244**	**17,266,141,561**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,195,284,919	1,633,799,696
සහනාධාර සහ මාරුකිරීම්	12,511,326	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,039,297	-
මූල්‍ය පිරිවැය - භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	10,423,457,034	13,559,852,772
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**11,634,292,576**	**15,193,652,468**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**664,184,668**	**2,072,489,093**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	2,108,161
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරකම් අයකර ගැනීම්	966,903	36,413,247
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**966,903**	**38,521,408**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	642,236,363	1,051,768,007
අත්තිකාරකම් ගෙවීම්	22,745,852	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**664,982,215**	**1,051,768,007**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(664,015,312)**	**(1,013,246,599)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**169,356**	**1,059,242,494**
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	949,102	782,390
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**949,102**	**782,390**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	1,118,458	6,288,934
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**1,118,458**	**6,288,934**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(169,356)**	**(5,506,544)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**0**	**1,064,749,038**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන (i)

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
පාඩු සහ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මු.රෙ 106 සහ මු.රෙ. 113 යටතේ වන පාඩු)

වැඩසටහන් අංකය සහ නාමය 1 මෙහෙයුම් වැඩසටහන

(i) **වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපා හැරීම/අත්හැරීම පිළිබඳ ප්‍රකාශය**

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු.)
රු.	25,000.00	අඩු	-	නැත
රු.	250,000.01	වැඩි		
	එකතුව		-	

	අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු.)
1			නැත
2			
	එකතුව		නැත

(ii) **තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය**

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු.)
රු.	25,000.00	අඩු		නැත
රු.	250,000.01	වැඩි		
	එකතුව			නැත

(ii)

අනුව කාල විශ්ලේෂණය		
වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව-01 ගණන	
වසර 5 - 10	සිද්ධි සංඛ්‍යාව ගණන	රු.
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව ගණන	රු.

	අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු.)
1			නැත
2			
	එකතුව		නැත

සටහන - -වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම් ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ. 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුලත් කළ යුතුය.

ප්‍රධාන ගණකාධිකාරී
දිනය:

සටහන (ii)

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
පොත් වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

වැඩසටහන් අංකය සහ නාමය 1 මෙහෙයුම් වැඩසටහන

1 **වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය**

	අගය	සිද්ධි සංඛ්‍යාව		වටිනාකම (රු).	
(i)	රු.25,000.00 අඩු	*නැත*			*නැත*
(ii)	රු.25,000.01 වැඩි	*නැත*			*නැත*
	එකතුව				

2 **වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය**

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය (රු.)	අලාභයේ වටිනාකම (රු.)	අයකර ගැනීම (රු)	පොතෙන් කපා හල අගය (රු.)	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය (රු.)	පොතෙන් කපා හැරීම සඳහා අනුමැතියේ යොමු අංකය
1						
2						
3	*නැත*					
4						
එකතුව						

සටහන - සටහන(i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ.109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතුය.

....
ප්‍රධාන ගණකාධිකාරී
දිනය:

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

වැඩසටහන් අංකය සහ නාමය 1
මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ /ආයතනයේ නම	බැදීම් අංකය	මාසය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	මූල්‍යකරණය	අයිතමය පිළිබද විස්තරය	බැදීම්	බැදීම් ශේෂය	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වටිනාකම	බැරකම් මදහා වන සංඟශෝධනයන්	බැරකම් නිදහස් කිරීම	බැරකම් ශේෂය
1.අමාත්‍යාංශ / රජයේ දෙපාර්තමේන්තු																	
දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට	-	-	-	226	1	1	0	1403	11	විදුලිය හා ජලය	-	-	2019.12.31	5684	-	-	-
එකතුව														**5,684**			
2. රාජ්‍ය සංස්ථා/ව්‍යාස්ථාපිත මණ්ඩල																	
සාමාන්‍යධාරි ත්‍රිකුණාමලය විවිධසේවා සමුපකාර සමිතිය	-	-	-	226	1	1	0	1,202	11	ඉන්ධන	-	-	2019.12.31	4,160	-	-	-
සාමාන්‍යධාරි හම්බන්තොටවිවිධසේවා සමුපකාර සමිතිය	-	-	-	226	1	1	0	1,202	11	ඉන්ධන	-	-	2019.12.31	17,680	-	-	-
ලේකම් සුහසාදක සංගමය	-	-	-	226	1	1	0	1,203	11	ආහාර හා නිළ ඇදුම්	-	-	2019.12.31	3,975	-	-	-
ජාතික ජලසම්පාදන මණ්ඩලය	-	-	-	226	1	1	0	1,403	11	විදුලිය හා ජලය	-	-	2019.12.31	212,408	-	-	-
ලංකා විදුලි බල මණ්ඩලය	-	-	-	226	1	1	0	1,403	11	විදුලිය හා ජලය	-	-	2019.12.31	114,365	-	-	-
වරාය අධිකාරිය	-	-	-	226	1	1	0	1,403	11	විදුලිය හා ජලය	-	-	2019.12.31	25,159	-	-	-
එකතුව														**377,747**			
3.වෙනත් (පෞද්ගලික අංශය)												-					
ඩබ් නන්දන (4)	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	114,209	-	-	-
ඒචි ඒල් ඩි නුවන්	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	26,891	-	-	-
RG ධර්මදාස	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	58,490	-	-	-
H T රණතුංග	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	62,688	-	-	-
K L A ෙක්සරසිංහ	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	23,018	-	-	-
K M අජිත් කුමාර	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	25,788	-	-	-
W A ඉන්දුසිරි	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	28,828	-	-	-
Y ධර්මදාස	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	26,272	-	-	-
C ජයසිංහ	-	-	-	226	1	1	-	1,002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	-	-	2019.12.31	24,336	-	-	-
අනියම් කම්කරු වැටුප්	-	-	-	226	1	1	-	1,001	11	වැටුප් හා වේතන	-	-	2019.12.31	31,235	-	-	-
අනියම් කම්කරු වැටුප්	-	-	-	226	1	1	-	1,001	11	වැටුප් හා වේතන	-	-	2019.12.31	108,730	-	-	-
එච්.කේ.ආර්. සෙනෙවිරත්න ඇතුළු පිරිස	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	176,760	-	-	-
එච්.එල්.ඩී. නුවන්	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	24,800	-	-	-
එච්. සුමිත් චමින්ද පීරිස්	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	21,000	-	-	-
කේ.එල්.එස්. ට්‍රිලන්ති	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	21,488	-	-	-
ඩී. නානායක්කාර	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	44,050	-	-	-
එස්.පී. අල්ගම මයා ඇතුලු	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	30,400	-	-	-
කේ.කේ. ගෙතමසිරි ඇතුලු	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	56,750	-	-	-
කේ.එල්.ඒ. කේසරසිංහ	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	18,900	-	-	-
කේ.එම්. අජිත් කුමාර	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	19,950	-	-	-
ඩබ්.ඒ. ඉන්දුසිරි	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	26,600	-	-	-
වි.තමරාසා මයා ඇතුලු	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	31,644	-	-	-
වයි. ධර්මදාස	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	15,750	-	-	-
එල්.එම්. තිලකරත්න	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	1,050	-	-	-
එල්. ජයසිංහ	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	27,930	-	-	-
ඒ.එම්.පී.කේ. අලහකෝන් ඇතුලු	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	21,500	-	-	-
එච්.කේ.ඩී. ඩිල්ෂානි මිය	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	19,560	-	-	-
කේ.ජී.ටී. අජිත් කුමාර ඇතුලු	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	29,708	-	-	-
ආර්. ලක්ෂ්මන් ගුණසිරි ඇතුලු	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	2,800	-	-	-
පී.කේ. කුමාරගේ	-	-	-	226	1	1	-	1,101	11	ගමන් වියදම්	-	-	2019.12.31	18,410	-	-	-
ඩී.ඩී.එස්.එම්.ජයවීර	-	-	-	226	1	1	-	1,202	11	ඉන්ධන	-	-	2019.12.31	1,560	-	-	-
ටී.වේරගොඩ	-	-	-	226	1	1	-	1,202	11	ඉන්ධන	-	-	2019.12.31	2,080	-	-	-
සී.එම්. මුණසිංහ ඇතුලු(4)	-	-	-	226	1	1	-	1,202	11	ඉන්ධන	-	-	2019.12.31	17,985	-	-	-
එම්.පී.සී.එස්. LTD Trincomalee	-	-	-	226	1	1	-	1,202	11	ඉන්ධන	-	-	2019.12.31	5,200	-	-	-
නියෝජ්‍ය පාලක වව්නියාව	-	-	-	226	1	1	-	1,203	11	ආහාර හා නිළ ඇඳුම්	-	-	2019.12.31	4,650	-	-	-
හයිටෙක් ආයතනය	-	-	-	226	1	1	-	1,302	11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	-	-	2019.12.31	54,505	-	-	-
ඒ සී ෆරීඩා බීබී	-	-	-	226	1	1	-	1,404	11	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	-	-	2019.12.31	700,000	-	-	-
එල් පී බී විජේසිරි	-	-	-	226	1	1	-	1,404	11	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	-	-	2019.12.31	150,000	-	-	-
එම් එන් රණසිංහ	-	-	-	226	1	1	-	1,404	11	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	-	-	2019.12.31	60,000	-	-	-
ක්‍රිෂාන්ත එන්ටප්‍රයිසස්	-	-	-	226	1	1	-	1,408	11	කල්බදු වාහන සඳහා ණය මුදල ආපසු ගෙවීම්	-	-	2019.12.31	163,000	-	-	-
නිපුන් ක්ලින්ක් සර්විස්	-	-	-	226	1	1	-	1,409	11	වෙනත්	-	-	2019.12.31	2,038,306	-	-	-
ඩබ් ඊ සෙකියුරිටි සර්විස්	-	-	-	226	1	1	-	1,409	11	වෙනත්	-	-	2019.12.31	1,892,800	-	-	-
එකතුව														**6,229,621**			
මුලු එකතුව														**6,613,052**			

ගෙවීම් / බැදීම්වල ස්වභාවය පහත සදහන් ආකාරයට හදුනා ගත යුතුය.

1.අමාත්‍යාංශ / රජයේ දෙපාර්තමේන්තු

2. රාජ්‍ය සංස්ථා/ව්‍යාස්ථාපිත මණ්ඩල

3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ ,සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගණුම් වර්ෂය තුළ දී එ සඳහා අදාළ ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැදීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ ,සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති,එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමග එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකගතාවයන්ය.

....
ප්‍රධාන ගණකාධිකාරී
දිනය:

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

වැඩසටහන් අංකය සහ නාමය 1 මෙහෙයුම් වැඩසටහන

	පුද්ගලයාගේ/ආයතනයේ නම*	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ 94 (2)හි සඳහන්ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම්	මු.රෙ 94 (3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1	**අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු**								
	දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1	-	1302	11	80,160,667	161,534,576	818,040
	පෝස්ට් මාස්ටර් ජනරාල්	තැපැල් හා සන්නිවේදන	1	-	1402	11	20,323,833	42,420,186	421,025
	එකතුව								**1,239,065**
2	**රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල**								
	නාගරික සංවර්ධන අධිකාරිය	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	1	-	1,404	11	148,944,667	373,254,648	2,252,929
	හම්බන්තොට වරාය අධිකාරිය	බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු	1	-	1,404	11	148,944,667	371,236,399	234,680
	එකතුව								**2,487,609**
3	**පෞද්ගලික අංශය**								
	දිරිදීමනා	වෙනත් දීමනා	1	0	1003	11	141189577.5	303761448	5568422
	එම්.ඩී.ඩී.යු. ගුණතිලක ඇතුලු(58)	ගමන් වියදම්	1	0	1101	11	17482500	53878792.9	592700
	පි.ඒ. ආරියදාස සහ පුත්‍රෙයා්	ඉන්ධන	1	0	1202	11	6755333.333	15881800.06	991839
	එම්.එච්. අජිත් ප්‍රසන්න	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	26600
	Neo tech MOTORS & service	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	38490
	පි.ඒ. ආරියදාස සහ පුත්‍රෙයා්	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	62313
	Perera Tyre Service (pvt) Ltd	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	86435
	Daya service Station & Motor Garaj	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	15321
	සී. සමන් කුමාර පෙරේරා	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	2500
	Sisan Service Center (pvt) Ltd	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	28210
	එල්.එම්. තිලකරත්න	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	6600
	වි.තමරාසා	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	18500
	Accmart Motors	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	94100
	U & H Wheel Service (pvt) Ltd	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	100611.73
	People's Insurance	වාහන නඩත්තු	1	0	1301	11	5100000	9325409.77	160374
	Epic Lanka (pvt) Ltd	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1	0	1302	11	80160666.67	161676702.2	960166
	Mobitel (pvt) Ltd	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1	0	1302	11	80160666.67	161676702.2	2246537
	IBM World Trad Corporcetion	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1	0	1302	11	80160666.67	161676702.2	4573141
	Mobitel (pvt) Ltd	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1	0	1302	11	80160666.67	161676702.2	826007
	SITA API	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1	0	1302	11	80160666.67	161676702.2	1288000
	Sri Lanka Telecom	දුරනතන වියදම්	1	0	1402	11	20323833.33	42507127.96	507967
	ලංකා බෙල්	දුරනතන වියදම්	1	0	1402	11	20323833.33	42507127.96	54682
	ශ්‍රී ලංකා ටෙලිකොම්	දුරනතන වියදම්	1	0	1402	11	20323833.33	42507127.96	638543
	ලංකා බෙල්	දුරනතන වියදම්	1	0	1402	11	20323833.33	42507127.96	275908
	Car Vision Engineering	වාහන	1	0	2003	11	1916666.667	4255850	255850
	G.N.J.Auto Motors	වාහන	1	0	2003	11	1916666.667	4255850	198325
	ලියනගේ මෝටර්ස්	වාහන	1	0	2003	11	1916666.667	4255850	171560
	ඊවිස් පෙරිපිලර්ස්	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	1	0	2103	11	28666666.67	32884956.34	1548400
	රොටෙල්කෝ සන්නිවේදන පද්ධතිය	වේලා සටහන් යන්ත්‍ර සවි නිරීම	1	0	2103	11	28666667	2689800	526500
	එකතුව								**21864602**
	මුළු එකතුව								**25,591,276**

ප්‍රධාන ගණකාධිකාරී
නම
දිනය

(සටහන - v)

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

වැඩසටහන් අංකය සහ නාමය 1 මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය)		වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පත් ගණුම් අංකය	මාරු කරන ලද මුදල (රු.)
				ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1	අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු එකතුව	නැත							
2	රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල එකතුව	නැත							
3	පෞද්ගලික අංශය එකතුව	නැත							
	මුළු එකතුව								

ප්‍රධාන ගණකාධිකාරී

නම

දිනය

(සටහන - vi)

වැය ශීර්ෂ අංකය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

වැඩසටහන් අංකය සහ නාමය 1 මෙහෙයුම් වැඩසටහන

		රු.
1	ප්‍රතිපූරණය කළ හැකි විදේශාදාර යටතේ,පරිපූරක වෙන් කිරීම්ද ඇතුළුව 2019 ඇස්තමේන්තු ගත වෙන් කිරීම්.	නැත
2	ඉහත (1) ට අදාල 2019 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම.	නැත
3	2019 ජනවාරි 01 වන දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාල හිමිකම් පෑම් වල එකතුව.	නැත
4	2018 හා එයට පෙර වර්ෂ වලට අදාලව,2019 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම් වල එකතුව	නැත
5	2019 වර්ෂය සම්බන්ධයෙන් 2019 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව.	නැත
6	2018 හා එයට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම් පෑම් සම්බන්ධයෙන් 2019 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම්	නැත
7	2019 වර්ෂය සම්බන්ධයෙන් 2019 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව.	නැත
8	2018 හා එයට පෙර වර්ෂ වෙනුවෙන් 2019 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව.	නැත
